(1)

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018 . 01 . 22

පැමිණිලිකරු : ජී.එස්.එම්. සෙයිඩ් මහතා.
නො. 35, යුනිටි පෙදෙස,
කොල්ලුපිටිය.

වගඋත්තරකරුවන් : විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ.

<u>පැමිණිලි අංකය : **HRC/1016/16**</u>

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා 2016 වසරේ පළමු ශ්‍රේණියට කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහා ස්ථාන මාරුවීම් ගණය යටතේ අයදුම්පත් යොමු කරන ලද බවත්, සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලකුණු 90 ක් ලබාදී පසුව අභියාචනයේදී ලකුණු 90.5 ක් දක්වා වැඩි වූ බවත් දක්වා ඇත. පැමිණිලිකරුගේ සේවා කාලය වසර 10 ක් සඳහා ලකුණු 10 ක් හිමිවිය යුතු වුවද ලබාදී ඇත්තේ ලකුණු 9.5 ක් බවත්, ඒ අනුව ලකුණු 0.5 ක් අහිමි කර ඇති බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත. මෙම ගණය යටතේ පාසැලට ඇතුලත් කිරීමේ කඩඉම් ලකුණු සීමාව ලකුණු 92 ක් වන බවත්, ඒ අනුව පැමිණිලිකරු පොරොත්තු ලේඛනයේ සිටි බවත් ප්‍රකාශ කර ඇත.

මීට අමතරව පොරොත්තු ලේඛනයේ හෝ ස්ථිර ලේඛනයේ නම නොමැති දරුවෙකු වන බී.ඕ.ජී. හේමවංශ යන දරුවා පාසැලට ඇතුලත් කරගෙන ඇති බවත්, මෙම දරුවාගේ ස්ථිර පදිංචි ස්ථානය ලෙස දක්වා ඇත්තේ කොල්ලුපිටිය ප්‍රසිද්ධ ව්‍යාපාරික ස්ථානයක ලිපිනයක් බවත්, ඒ අනුව මෙම දරුවා පාසැලට ඇතුලත් කිරීමට සුදුසුකම් නොමැති අයෙකු වුවද වගඋත්තරකරුවන් මෙම දරුවා විද්‍යාලයට ඇතුලත් කර ගැනීම තුළින් තවදුරටත් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
විද්‍යුත් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකරුවන් මෙම පැමිණිල්ලට අදාලව කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ ස්ථාන මාරුවීම් ගණය යටතේ 2016 වසරේ විද්‍යාලයට ළමුන් ඇතුළත් කර ගෙන ඇත්තේ ලකුණු 92 ට වඩා වැඩියෙන් ලබාගත් අය බවත්. පැමිණිලිකරු ලබාගෙන ඇත්තේ ලකුණු 90 ක් බවත්. පැමිණිලිකරුගේ ස්ථිර පත්වීම් දිනයේ සිට අයදුම්පත් ඉදිරිපත් කරන දිනය වනවිට පැමිණිලිකරුගේ සේවා කාලය වසර 9 1/2 ක් බවත්. ඒ අනුව වසරකට ලකුණු 01 බැගින් ලකුණු 09 ක් ලබාදී ඇති බවත්. අභියාචනා පරීක්ෂණයේදී ඉන් මාස 06 ක් වෙනුවෙන් තවත් ලකුණු 0.5 ක් ලබාදීමට සලකා බලා ඇති බවත්. එසේ වුවද පැමිණිලිකරුට හිමිවන සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලකුණු 90.5 ක් බැවින් කඩඉම් ලකුණු සීමාව ඉක්මවා නොමැති බැවින් පාසැලට ඇතුළත් වීමට සුදුසුකම් නොලබන බවත් දක්වා ඇත.

මීට අමතරව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති අනෙක් කාරණය වන පොරොත්තු ලේඛනයේ හෝ ස්ථිර ලේඛනයේ නම නොමැති බී.ඕ.ජ්.හේමවංශ නැමති දරුවෙකුට ලකුණු 92 ක් ලබාදී විද්‍යාලයට ඇතුළත් කර ගැනීම හා එම දරුවා පදිංචි ස්ථානය ව්‍යාපාරික ස්ථානයක් බව පැමිණිලිකරු හඳුනාගෙන තිබීම යන කාරණා පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැවති විමර්ශනයේදී වගඋත්තරකරුවන්ට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත්. එම සත්‍යතාවය බිඳ හෙළීමට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත් වී ඇත. ඒ වෙනුවට වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදී ඇති ලේඛන වල නිරවද්‍යතාවය ප්‍රකාශ කර ඇත. (උදා : ස්ථාන මාරුවීම හා ලබානොගත් නිවාඩු වාර්තා පිළිබඳව විස්තර)

ඒ අනුව කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද විමර්ශනයේදී පහත නිරීක්ෂණ හා නිගමන වලට එළඹී ඇත.

**නිරීක්ෂණ හා නිගමන :-**

1. පැමිණිලිකරුගේ දරුවා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමේදී පැමිණිලිකරුට හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය 91 ක් බව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද වාචික හා ලිඛිත ලේඛන අනුව නිරීක්ෂණය වේ.

2. දෙපාර්ශවය ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික සාක්ෂි අනුව විද්‍යාලයට ඇතුළත් කරගැනීමේ කඩඉම් ලකුණු සීමාව ලකුණු 92 කි.

3. පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයට භාජනය කර වගඋත්තරකරු විසින් ලකුණු 90 ක් ලබාදී ඇති බව සහ 90.5 ක් දක්වා එම ලකුණු ප්‍රමාණය ලැබිය යුතු බව වගඋත්තරකරුවන් පිළිගෙන ඇති අතර. ලකුණු 91 ක් හිමිවිය යුතුය යන කාරණය වගඋත්තරකරුවන් ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලෙස දක්වා ඇත්තේ. අයදුම්පත් ඉදිරිපත් කරන දිනය වනවිට පැමිණිලිකරුගේ ස්ථිර සේවා කාලය වසර 10 ක් සම්පූර්ණ නොවීම යන කාරණය වේ. පැමිණිලිකරුගේ ප්‍රකාශයේ දක්වා ඇත්තේ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට තමා වසර 10 ක් සම්පූර්ණ කරන බැවින් තමාට ලකුණු 10 ක් ඒ සඳහා හිමිවිය යුතුය යන්නයි. නමුත් පැමිණිලිකරු අයදුම්පත් භාරදෙන දිනය වනවිට පැමිණිලිකරු අවුරුදු 9 1/2 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බැවින් ලකුණු 90.5 ක් ලබාදීමට බාධාවක් නොමැති බව නිරීක්ෂණය වේ.

4. පොරොත්තු ලේඛනයේ හෝ ස්ථිර ලේඛනයේ නොසිටි බී.ඕ.ජී. හේමවංශ නැමති දරුවාගේ පදිංචිය ප්‍රසිද්ධ ව්‍යාපාරික ස්ථානයක ලිපිනයක් බව පැමිණිලිකරු විසින් කරුණු ඉදිරිපත් කර ඇතත්. වගඋත්තරකරුවන් විසින් එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය වේ.

5. එමෙන්ම. වගඋත්තරකරුවන් විසින් බී.ඕ.ජී. හේමවංශ නැමති දරුවා වක්‍රලේඛනයට පරිභාහිරව විද්‍යාලයට ඇතුලත් කර ඇති බැවින් ඒ පිළිබඳව වගඋත්තරකරුවන් වගකිව යුතු වන අතර. ඒ පිළිබඳව අමාත්‍යංශ මට්ටමින් විමර්ශනයක් සිදුකර වැරදිකරුවන් සම්බන්ධව විනයානුකූලව පියවර ගත යුතු බව කොමිෂන් සභාවේ නිගමනයයි.

6. පැමිණිලිකරුට ලකුණු 90 ක් ලබාදීමෙන් පසු පැමිණිලිකරු පොරොත්තු ලේඛනයේ 5 වන ස්ථානයේ සිටින බව ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වී ඇත. පැමිණිලිකරුට සේවා කාලය සඳහා ලකුණු ලබාදීමේදී ලකුණු 0.5 ක් අඩුවෙන් ලබාදී ඇති බව විමර්ශනයේදී හෙළිවී ඇති අතර. එම ලකුණු 0.5 සමග පැමිණිලිකරුට හිමිවන ලකුණු සංඛ්‍යාව 90.5 ක් වේ.

පොරොත්තු ලේඛනයේ පැමිණිලිකරුට වඩා ඉහළින් සිටින හතර දෙනා අතුරෙන් ලකුණු 90 ක සීමාවේ දෙදෙනෙකු 92 සීමාවේ එක් අයෙකු ද. ලකුණු 94 සීමාවේ එක් අයෙකු ද සිටින බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරුට ලකුණු 90.5 හිමිවන විට පැමිණිලිකරු පොරොත්තු ලේඛනයේ 5 වන ස්ථානයේ සිට 3 වන ස්ථානයට පැමිණේ.

ඒ අනුව පොරොත්තු ලේඛනයේ ලකුණු 94 න් 92 ස්ථානයේ සිට දරුවන් ඇතුලත් කිරීමෙන් පසුව ඇති වන පුරප්පාඩු සඳහා පැමිණිලිකරුගේ දරුවා සුදුසුකම් ලබන බවද කොමිෂන් සභාව නිගමනය කරයි.

නිර්දේශය :-

ඉහත නිරීක්ෂණ අනුව පැමිණිලිකරුගේ දරුවා විද්‍යාලයට ඇතුලත් කිරීමට කඩඉම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබාගෙන ඇති බවට කරුණු අනාවරණය වී නොමැති වුවද පොරොත්තු ලේඛනයේ පළවන ස්ථානයේ සහ දෙවන ස්ථානයේ සිටින දරුවන් විද්‍යාලයට ඇතුලත් කර ඇති බැවින් පැමිණිලිකරු හට ලකුණු 90.5 ක් හිමිවන බැවින් හා පොරොත්තු ලේඛනය අනුව තුන්වන ස්ථානය හිමිවන බැවින් එම ස්ථානයේ ඇති වන පුරප්පාඩුව පැමිණිලිකරුගේ දරුවා ඇතුලත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බැවින් දරුවා පාසලට ඇතුලත් කර ගැනීමට කටයුතු කළ යුතු බවට වගඋත්තරකරුවන් වෙත නිර්දේශ කරනු ලැබේ.

වගඋත්තරකරුවන් විසින් 2016 වසරේ රාජකීය විද්‍යාලයේ 01 ශ්‍රේණියට බී.ඔ.ජ්. හේමවංශ නැමති දරුවා චක්‍රලේඛනයට පරිබාහිරව ඇතුලත් ඇති බැවින් චක්‍රලේඛනය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමටත් කටයුතු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මෙහි පිටපතක් යොමු කරනු ලැබේ.

2018.02.22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.